# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2141/50 - 2019 සැප්තැම්බර් මස 18 වැනි බදාදා - 2019.09.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2133/4 හා 2019 ජූලි 22 වන දින දරන අති විශේෂ ගැසට් නිවේදනය සංශෝධනය කිරීම පිණිස වන ගැසට් නිවේදනයයි**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා වෙත නාගරික සංවර්ධන අධිකාරියේ නීතිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 2133/4 හා 2019 ජූලි 22 වන දින දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය සංශෝධනය කිරීම එහි සඳහන් පත්කළ නිලධාරීන් ලැයිස්තුවද ඇතුළත් කරමින්, මූලික *ගැසට්* නිවේදනයට සමරූපීව අර්ථවත් වන අයුරින් පහත උපවගන්තිද එක් කරමින් සංශෝධනය කරමි.

1. උපදේශන කමිටුව වෙත පැවරී ඇති පහත දැක්වෙන විෂයන් හා ඊට අනුශාංගික විෂයන් සම්බන්ධයෙන් සිය ප්‍රවීණතාවය හා විඥානය භාවිතා කරමින් අමාත්‍යවරයාගේ උපදේශකවරුන් වශයෙන් සිය කාර්යභාරය ඉෂ්ට කිරීමට මෙයින් බලය පැවරෙනු ඇත.

   (අ) විශේෂ අවශ්‍යතාවලින් හෙබි නිවාස සඳහා ඇති ඉල්ලුම පිළිබඳව පරිපූර්ණ විමර්ශනයක් සිදු කිරීම
   (ආ) කාලෝචිතව අවශ්‍ය පරිදි සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම
   (ඇ) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ''නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය'' යටතේ අයදුම්කරුවන් විසින් කරනු ලබන ඉල්ලීම් භාර ගැනීම

2. ඉදිරි දිශානතීන් හා ක්‍රමෝපායන් හා ඊට අදාළ නිර්දේශ පිළිබඳව අමාත්‍යවරයාට උපදේශන සේවා ලබාදීමද උපදේශන කමිටුවේ කාර්යභාරය (වගකීම) වන්නේ ය.

3. අමාත්‍යවරයා විසින් කාර්යසාධනය පිළිබඳව හා උපදේශන කමිටුව වෙත පැවරී ඇති බලතල පිළිබඳව ලිඛිතව විශේෂ හා පොදු උපදෙස් ලබා දෙනු ලබන අතර, උපදේශන කමිටුව එකී උපදෙස් ක්‍රියාවට නංවනු ඇත.

4. උපදේශන කමිටුවේ කාර්යසාධනය මත, ඉදිරිසේවා දිගුවකට යටත්ව උපදේශන කමිටුව සාමාජික තනතුර මූලික වශයෙන් 2019 ජූලි 1 වන දා සිට 2020 ජූලි 1 වන දින දක්වා බල පැවැත්වේ.

5. යම් සාමාජිකයෙක් ඔහුගේ නිළයෙන් ඉල්ලා අස්වීම හෝ සේවා කාලය පූර්ණවීම මත එකී තනතුර පුරප්පාඩු වන්නේ නම්, එකී තනතුර නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේ ය.

6. (අ) අමාත්‍යවරයාට ලිඛිතව යොමු කරනු ලිපියක් මගින් උපදේශන කමිටුවේ යම් සාමාජිකයෙකුට සිය තනතුරෙන් ඉල්ලා අස්විය හැක.

   (ආ) අයහපත් සෞඛ්‍ය තත්වයක්, විදෙස්ගතවීමක් හෝ වෙනයම් හෝ හේතුවක් නිසා උපදේශන කමිටුවේ යම් සාමාජිකයෙකු සිය තනතුරේ කාර්යභාරය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන්නේ නම්, එකී කාලපරිච්ඡේදය තුළ එකී කමිටු සාමාජිකයාගේ වගකීම් ඉටු කිරීම පිණිස අමාත්‍යවරයා විසින් වෙනත් නිළධාරියෙක් පත් කරනු ඇත.

7. උපදේශන කමිටු සාමාජිකයින්ගේ අනෙකුත් නිළධාරීන්ගේ හා සේවක වේතන අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන අරමුදලකින් ගෙවනු ඇත.

8. උපදේශක කමිටුවට අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, මෙම නිළතල යටතේ සිය රාජකාරි කටයුතු ඉටු කිරීමට සහායවීම සඳහා එවැනි නිලධාරීන් හෝ සේවකයින් පත් කළ හැකිය.

9. අංක 2133/4 හා 2019 ජූලි 22 වන දින පළවූ පූර්වගාමී ගැසට් නිවේදනයේ මෙකී විධිවිධාන සඳහන්ව තිබුනද, මෙහි සඳහන් අළුතින් මින්පෙර සම්මත කරන ලද උප වගන්ති 2019 ජූලි මස 22 වන දින සිට ක්‍රියාත්මක වූ බව සලකනු ලැබේ.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 16 වැනි දින,
17 හා 18 මහල,
''සුහුරුපාය''
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

10 - 80

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.